ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 අගෝස්තු මස 07 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 අගෝස්තු**

ඉහළ ආනයන වර්ධනය සහ ඉහළ ණය ප්‍රසාරණය අඩු කිරීම අරමුණුකොටගෙන මෙම වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙමින් පවතී. විදේශීය අංශය තුළ, 2012 ජූනි මාසයේ දී ආනයන මත වූ වියදමෙහි අඩුවීම සහ ඊට අනුරූපීව 2012 දෙවැනි කාර්තුවේ දී වෙළෙඳ ගිණුමෙහි හිඟය අඩුවීම මූලික ඇස්තමේන්තුවලින් පිළිබිඹු වෙයි. මුදල් අංශය තුළ, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 අප්‍රේල් මාසයේ වූ සියයට 22.9 සිට 2012 ජූනි මාසයේ දී සියයට 20.5 ක් දක්වා අඩු විය. මේ අතර, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වර්ධනය, 2011 දෙවැනි භාගයේ දී පැවති සියයට 18.1 සිට 2012 ප්‍රථම භාගයේ දී සියයට 11.4 ක් දක්වා අඩු විය.

ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා ආර්ථිකයන්හි යථාතත්ත්වයට පත්වීම තවදුරටත් මන්දගාමීව සිදුවීමත් සමග ගෝලීය ආර්ථික තත්ත්වයන් වඩා අහිතකර තත්ත්වයට පත්වෙමින් පවතී. කෙසේවෙතත්, 2012 වසර සඳහා වූ ආර්ථික වර්ධන පුරෝකථනයන් සියයට 7.2 ක් දක්වා අඩුකරනු ලැබූ කාලයේ දී අපේක්ෂා කළ මට්ටමට වඩා මෙම අහිතකර ගෝලීය තත්ත්වයන් ශ්‍රී ලංකා ආර්ථිකයට බලනොපානු ඇත. එමෙන්ම, ණය සීමාකිරීම මධ්‍යයේ වුවද, බලපත්‍රලාභී බැංකු විසින් වසරේ දෙවැනි භාගයේ දී තවදුරටත් ලබාදීමට ඇති ණය ප්‍රමාණය, සංශෝධිත වර්ධන මාවත ඔස්සේ

පහසුවෙන් ගමන් කිරීමට උපකාරී වනු ඇත. මේ අනුව, අහිතකර ගෝලීය තත්ත්වයන් එසේ තිබියදීත් ආර්ථික වර්ධන ඇස්තමේන්තු තවමත් ළඟාකර ගතහැකි මට්ටමේ පවතින බව පෙනෙයි.

මේ අතර, 2012 ජූලි මස අවසානය වන විට, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත ඇදී ආ ශුද්ධ සමුච්චිත විදේශීය ආයෝජන පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 205 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 842 ක් ඉක්මවීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සමීපස්ථ ණය පහසුකම යටතේ අවසාන වාරිකය වශයෙන් ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 414, 2012 ජූලි මාසයේ සාර්ථකව නිකුත් කළ පස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද එ.ජ.ඩොලර් බිලියනයක ලැබීම් සහ අනෙකුත් විදේශීය ලැබීම් ප්‍රවාහ සමග 2012 ජූලි මාසය අවසාන වන විට දළ නිල විදේශීය සංචිතය එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙවැනි මට්ටමක සංචිත, ආනයනික මාස 4.2 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වන අතර, මෙලෙස අපේක්ෂිත පරිදි විදේශීය අංශයේ තත්ත්වය ශක්තිමත් වීම විදේශීය ආයෝජන ප්‍රවාහ තවදුරටත් ආකර්ෂණය කරගැනීමට ඉවහල් වනු ඇත. මේ අනුව, ආර්ථිකය බලාපොරොත්තු වූ සාර්ව ආර්ථික ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා නියමිත මාර්ගයේ ගමන් කරමින් සිටී.

එසේ නමුත්, පසුගිය වසර 3 1/2 ක කාලයක් තුළ තනි අංකයක මට්ටමේ පැවැතුණු උද්ධමනය ඉහළ ගිය අතර, ඒ අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය, ජූනි මාසයේ පැවැති සියයට 9.3 ක සිට 2012 ජූලි මාසයේ දී සියයට 9.8 ක් දක්වා වැඩි වුවද, 2012 පෙබරවාරි මාසයේ සිට වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 6 ක පමණ මට්ටමේ පවතියි. උද්ධමනයෙහි ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම අහිතකර කාලගුණික තත්ත්වයන් සහ එමගින් දේශීය ආහාර සැපයුමට පැවති බාධාවන්හි ප්‍රතිඵලයක් ලෙස සිදුවිය. කෙසේ වෙතත්, නුදුරු කාලයේ දී යම් තාවකාලික උද්ධමනාත්මක පීඩනයක් පැවතිය හැකි නමුත්, දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන් මෙන්ම මෑතක දී ගත් ක්‍රියාමාර්ග මගින් වසරේ ඉතිරි කාලය තුළ දී පාරිභෝගික මිල උද්ධමනය තනි අංකයක මට්ටමට අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම දේශීය ගෑස් මිල ගණන් පහළ දැමීම සහ තෝරාගත් ආනයනික ආහාර ද්‍රව්‍ය මත වූ බදු අඩු කිරීම කෙටිකාලීනව උද්ධමනයට ඇති කරනු ලබන තර්ජන අඩු කිරීමට හේතුවනු ඇති අතර, පවත්නා දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මැදිකාලීනව ඉල්ලුම් අංශයෙන් ඇති වන උද්ධමනාත්මක පීඩනයන් යටපත්කර එමගින් උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

වර්තමාන සාර්ව ආර්ථික වර්ධනයන් සහ විදේශීය සහ මුදල් අංශය මත දැනටමත් ගෙන ඇති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබඳව සලකා බලා, 2012 අගෝස්තු 06 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී මහ බැංකුවෙහි දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව ද, ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.75 ක් සහ සියයට 9.75 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට ද තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.